සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / *All Rights Reserved*

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education – Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: **10** | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: **I** | කාලය / காலம் / Time: පැය 02 යි. |

නම :-..........................................................................

විභාග අංකය :- .................................

නිවැරදි බවට සහතික කරමි.

.....................................
ශාලා නිරීක්ෂකගේ අත්සන

**වැදගත් :**

* මෙම ප්‍රශ්න පත්‍රය පිටු **8** කින් සමන්විතය.
* **මෙම පිටුවේත්, තුන්වැනි පිටුවේත්** නියමිත ස්ථානවල ඔබේ **විභාග අංකය** නිවැරදිව ලියන්න.
* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරත් එම පිළිතුර ලබාගත් ආකාරයත් දැක්වීමට ඒ ඒ ප්‍රශ්නය යටින් තබා ඇති ඉඩ ප්‍රමාණය ප්‍රයෝජනයට ගන්න.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **අදාළ පියවර** හා **නිවැරදි ඒකක** දක්වන්න.
* පහත දක්වා ඇති පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

  **A කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 2 බැගින්.

  **B කොටසෙහි**
  එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින්.
* කටු වැඩ සඳහා හිස් කඩදාසි ලබාගත හැකිය.

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| **A** | **1 – 25** | |
| **B** | **1** | |
| | **2** | |
| | **3** | |
| | **4** | |
| | **5** | |
| එකතුව | | |

| | |
|---|---|
| .......................... පළමු පරීක්ෂක | .......................... සංකේත අංකය |
| .......................... දෙවන පරීක්ෂක | .......................... සංකේත අංකය |
| .......................... ගණිත පරීක්ෂක | .......................... සංකේත අංකය |
| .......................... ප්‍රධාන පරීක්ෂක | .......................... සංකේත අංකය |

A කොටස


**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**01.** මිනිසුන් 4 දෙනෙක් දින 5 කින් නිම කිරීමට තීරණය කර ඇති වැඩක් මෙන් දෙගුණයක වැඩක් මිනිසුන් 10 දෙනෙකුට දින කීයකින් අවසන් කළ හැකි ද?


**02.** සාධක සොයන්න. $x^2 - x - 6$

www.mathsland.org

**03.** රූපයේ දී ඇති තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.





**04.** රූපයේ දක්වා ඇති කේන්ද්‍රික ඛණ්ඩයේ පරිමිතිය 39 cm ක් වේ.
එහි අරය 14 cm ක් නම් චාප දිග සොයන්න.



**05.** සුළු කරන්න. $\frac{1}{x} - \frac{3}{4x}$


**06.** රූපයේ දී ඇති තොරතුරු අනුව $B\hat{A}D$ විශාලත්වය සොයන්න.




**07.** $\sqrt{42}$ හි අගය පළමු සන්නිකර්ෂණයට සෙවූ විට ලැබෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**(i)** 6.3 **(ii)** 6.4 **(iii)** 6.5 **(iv)** 6.6

**08.** රූපයේ දක්වා ඇති ඝනකාභ හැඩැති ටැංකියේ ධාරිතාව ලීටර් වලින් සොයන්න. ($1\ m^3 = 1\ 000l$)




**09.** රූපයේ තොරතුරු අනුව $x$ හි අගය සොයන්න.




**10.** විසඳන්න. $\frac{x}{2} - 1 = 5$

**11.** ටැංකියේ ධාරිතාවය $\frac{7}{8}$ ක් පිරී ඇති ජල ටැංකියකින් $\frac{5}{7}$ ක් භාවිතයට ගත්තේ නම් භාවිතයට ගත් ජල ප්‍රමාණය ටැංකියෙන් කවර භාගයක් ද?


www.mathsland.org

**12.** පහත ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

| | |
|---|---|
| ත්‍රිකෝණයක අභ්‍යන්තර කෝණ තුනෙහි එකතුව $180^{o}$ ක් වේ. | |
| පාද දෙකක් සමාන වන ත්‍රිකෝණයක සමාන පාදවලට සම්මුඛ කෝණ සෑම විටම සමාන වේ. | |
| සෘජුකෝණී ත්‍රිකෝණයක් අංග සම වන්නේ කර්ණ පා අවස්ථාව යටතේ පමණි. | |


**13.** 1 සිට 5 තෙක් අංක ලියූ සර්වසම කාඩ්පත් 5 ක් අතුරින් අහඹුලෙස තෝරා ගන්නා ලද කාඩ්පතක් ඔත්තේ සංඛ්‍යාවක් සහිත කාඩ්පතක් වීමේ සම්භාවිතාව සොයන්න.

**14.** රූපයේ දී ඇති තොරතුරු අනුව AC දිග සොයන්න.





**15.** සාධාරණ පදය (Tn) = 3n + 2 වූ සංඛ්‍යා රටාවේ 10 වන පදය සොයන්න.


**16.** රූපයේ දැක්වෙන්නේ විෂ්කම්භය 14 cm ක් වූ අර්ධ වෘත්තයකි. එහි වර්ගඵලය සොයන්න.




**17.** ABC හා PQR ත්‍රිකෝණ පා.කෝ.පා. යටතේ අංගසමවීමට අවශ්‍ය ඉතිරි අංග යුගලය ලියන්න.




**18.** වෙන් රූපයේ දී ඇති තොරතුරු අනුව A′ කුලකය ලියා දක්වන්න.




**19.** පැයට කිලෝමීටර 60 ක ඒකාකර වේගයෙන් ගමන් කරන රථයකට 180 km ක දුරක් යාමට ගතවන කාලය පැය කීයක් වේද?


www.mathsland.org

**20.** (0 , 6) හා (1 , 4) ලක්ෂ්‍ය හරහා යන සරළ රේඛාවේ අනුක්‍රමණය සොයන්න.

**21.** පහත දී ඇති වීජීය ප්‍රකාශනවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

$4a^2b$ , $6ab^2$

**22.** රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් BC පාදයේ දිග සොයන්න.





**23.** $x - 3 \geq 2$ අසමානතාවය තෘප්ත කරන කුඩාම ධන නිඛිලය ලියන්න.

**24.** 2 , 4 , 6 , 8 , 9 , 11 , 15 , 17 , 20 , 21 , 25 යන සංඛ්‍යා ව්‍යාප්තියේ මධ්‍යස්ථය සොයන්න.

www.mathsland.org

**25.** OA හා OB ට සම දුරින් AB මත පිහිටි X නම් ලක්ෂ්‍යයක් පථ පිළිබඳ දැනුම ඇසුරෙන් ලකුණු කරන්න.



## B කොටස

**ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**

**01.** රෙදි ආශ්‍රිත නිෂ්පාදන අලෙවි කරන්නියක් විසින් රෙදි රෝලකින් $\frac{2}{5}$ ක් මේස රෙදි මැසීමට ද ඉතිරියෙන් $\frac{3}{4}$ ක් කොට්ට උර මැසීමට යොදා ගන්නා ලදී.

**(i)** මේස රෙදි මැසීමට යොදාගත් පසු ඉතිරි වූ ප්‍රමාණය මුළු රෙදි රෝලෙන් කවර භාගයක් ද?


**(ii)** කොට්ට උර මැසීමට යොදාගත් ප්‍රමාණය මුළු රෙදි රෝලෙන් කවර භාගයක් ද?

**(iii)** මේස රෙදි සහ කොට්ට උර මැසීමෙන් පසු ඉතිරි වූ රෙදි ප්‍රමාණය 9 m ක් නම් රෙදි රෝලේ තිබූ මුළු රෙදි ප්‍රමාණය මීටර කීයද?

**(iv)** මේස රෙද්දක් මැසීමට රෙදි 3 m ක් ද කොට්ට උරයක් මැසීමට රෙදි $\frac{1}{2}$ m ක් ද වැය වේ නම් මසන ලද මේස රෙදි ගණනත් කොට්ට උර ගණනත් වෙන වෙනම සොයන්න.

www.mathsland.org

**02.** මෙහි දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර කොටසකින් හා කේන්ද්‍රික ඛණ්ඩයකින් සමන්විත රූපයකි.




**(i)** BDC කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය සොයන්න.

**(ii)** ABDE කොටසේ වර්ගඵලය BCD කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලය මෙන් දෙගුණයක් නම් AB දිග සොයන්න.

**(iii)** CD චාප දිග සොයන්න.

**(iv)** මුළු රූපයේ පරිමිතිය සොයන්න.

**(v)** කේන්ද්‍රික ඛණ්ඩයේ වර්ගඵලයට සමාන වර්ගඵලයකින් යුත් AEF සෘජුකෝණී ත්‍රිකෝණාකාර කොටසක් දික්කළ BA මත AE ට මායිම් වන සේ එකතු කරනු ලබයි නම් AF හි දිග ගණනය කර මුල් රූපය මත AEF රූපය ඇඳ දක්වන්න.

**03.** කුකුළු ගොවිපලක කිකිළියන් 20 කට දින 30 ට ප්‍රමාණවත් වන සේ ආහාර ගබඩා කර ඇත.


**(i)** මෙම ආහාර ප්‍රමාණය එක් කිකිළියකට දින කීයකට සැහේද?

**(ii)** දින 18 කට පසු තවත් කිකිළියන් 10 ක් මෙම ගොවිපළට ගෙන එන ලද නම්, සියළුම කිකිළියන් සඳහා මෙම ආහාර දින කීයකට ප්‍රමාණවත් වේද?

**(iii)** මෙම කිකිළියන් 10 දෙනා එකතු වුව ද ඉන් දින 4 කට පසු කිකිළියන් 6 දෙනෙක් මිය ගියේ නම් ඉතිරි ආහාර දින කීයකට ප්‍රමාණවත් වේද?

**(iv)** අවසානයේ දී ගොවිපළේ ගබඩා කර තිබූ ආහාර දින කීයකට ප්‍රමාණවත් වීද?

**04.** ගොවි සංවිධානයකින් ලබාගත් තොරතුරු මත ගොවීන් 300 ක් වගා කරන බෝග පිළිබඳ තොරතුරු ඇසුරින් අඳින ලද වට ප්‍රස්තාරයක් මෙහි දැක් වේ.




**(i)** රබර් වගා කරන ගොවීන් ගණන කීය ද?

**(ii)** කුරුඳු වගා කරන ගොවීන් ගණන මෙන් හතර ගුණයක් පොල් වගා කරයි නම් පොල් වගා කරන ගොවීන් ගණන කීයද?

www.mathsland.org

**(iii)** තේ වගා කරන ගොවීන් දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය කීයද?

**(iv)** රබර් වගා කරන ගොවීන්ගෙන් $\frac{1}{3}$ ක් රබර් ගලවා කුරුඳු වගා කිරීමට තීරණය කළේ නම් ඒ අනුව අඳින ලද වට ප්‍රස්තාරයක කුරුඳු වගා කරන ගොවීන් දැක්වෙන කේන්ද්‍රික ඛණ්ඩයේ කෝණය කීයක් වේද?

**05.** $\varepsilon$ = { 1 , 2 , 3 , 4 , 5 , 6 , 7 , 8 , 9 , 10 } ද

A = { 2 , 4 , 6 , 7 } ද

B = { 1 , 4 , 7 , 9 , 10 } ද නම්,

www.mathsland.org

**(i)** $A \cap B$ ලියා දක්වන්න.

**(ii)** $A \cup B$ ලියා දක්වන්න.

**(iii)** $A'$ ලියා දක්වන්න.

**(iv)** $B'$ ලියා දක්වන්න.

**(v)** ඉහත තොරතුරු වෙන් රූප සටහනක දක්වන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved



පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ගණිතය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 03 යි. |

❖ **A කොටසින් ප්‍රශ්න 5 ක් ද B කොටසින් ප්‍රශ්න 5 ක් ද තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.**

❖ **එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 100 ක් හිමි වේ.**

## A කොටස

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

**01. (a)** පාවහන් නිෂ්පාදකයෙක් පාවහන් යුගලක් නිෂ්පාදනය කිරීම සඳහා රුපියල් 900 ක් වැය කරයි. නිෂ්පාදකයා එම පාවහන් යුගල 20% ක ලාභ ප්‍රතිශතයක් සහිතව වෙළෙන්දෙකුට විකුණයි.

**(i)** වෙළෙන්දා පාවහන් යුගල මිලදී ගැනීමට වැය කරන මුදල කොපමණද?

**(ii)** වෙළෙන්දා 25% ක ලාභ ප්‍රතිශතයක් තබාගෙන එය පාරිභෝගිකයාට විකුණයි නම් පාරිභෝගිකයා එය මිල දී ගැනීමට වැය කරන මුදල කොපමණද?

**(iii)** වඩා වැඩි ලාභයක් ලබන්නේ නිෂ්පාදකයා ද වෙළෙන්දා ද යන්න හේතු සහිතව ලියා දක්වන්න.

**(b)** රුපියල් 60 000 ට විකිණීමට මිල ලකුණු කර ඇති ශීතකරණයක් අත්පිට මුදලට විකිණීමේදී 12% ක වට්ටමක් ලබාදෙනු ලැබේ.

**(i)** ශීතකරණය මිලදී ගැනීමේදී ලැබෙන වට්ටම කොපමණද?

**(ii)** එහි විකුණුම් මිල සොයන්න.

**02.** $y = 3x - 2$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට සැකසූ අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

| $x$ | $-2$ | $-1$ | $0$ | $1$ | $2$ |
|---|---|---|---|---|---|
| y | $-8$ | .......... | $-2$ | .......... | $4$ |

**(i)** වගුවේ හිස්තැන් පුරවන්න.

**(ii)** ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳ දක්වන්න.

**(iii)** $y = 7$ වන විට $x$ හි අගය සොයන්න.

**(iv)** ඉහත බණ්ඩාංක තලයේම $y = 3x + 1$ ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

**(v)** ඉහත ශ්‍රිතවල ප්‍රස්තාර පිළිබඳව ඔබට කුමක් කිව හැකිද?

www.mathsland.org

**03. (a) (i)** සුළු කරන්න. $(2a + b)(a - b)$

**(ii)** සාධක සොයන්න. $2a^2 - 8$

**(iii)** මෙම වීජීය ප්‍රකාශනවල කුඩා පොදු ගුණාකාරය සොයන්න.

$3(x - y)$ , $(x^2 - y^2)$

**(b) (i)** සමචතුරස්‍රාකාර පිට්ටනියක පැත්තක දිග මීටර $(x + 5)$ නම් පිට්ටනියේ වර්ගඵලය $x$ ඇසුරෙන් සොයන්න.

**(ii)** $x = 5$ නම් පිට්ටනියේ වර්ගඵලය සොයන්න.

**04. (a)** විශාල ප්‍රමාණයේ පළතුරු යුෂ බෝතලයක ධාරිතාව $2.5\ l$ වේ. උත්සව අවස්ථාවක දී මෙම පළතුරු යුෂ වලින් සංග්‍රහ කිරීමේ දී වීදුරුවකට $250\ ml$ ක ප්‍රමාණයක් බීම වත් කරනු ලබයි. උත්සව අවස්ථාවට 325 දෙනෙකු සහභාගී වේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීමට අවශ්‍යවන විශාල ප්‍රමාණයේ අවම පළතුරු යුෂ බෝතල් ගණන සොයන්න.

**(b)** සමචතුරස්‍ර හැඩැති පතුලක් සහිත භාජනයක පතුලේ වර්ගඵලය $360\ cm^2$ වේ. එහි ජලය $7.2\ l$ ක් පුරවා තිබේ නම් භාජනයේ උස සොයන්න.

**05. (a)** පහත දී ඇති සරල සමීකරණ විසඳන්න.

$$\frac{a+2}{3} = 4$$

$$3x - 1 = 9 - 2x$$

www.mathsland.org

**(b)** අඹගෙඩි දෙකක් සහ දොඩම් ගෙඩියක් මිලදී ගැනීමට රුපියල් 100 ක් වැය වේ. අඹ ගෙඩියක් හා දොඩම් ගෙඩියක් මිලදී ගැනීමට රුපියල් 70 ක් වැය වෙයි. අඹ ගෙඩියක මිල රුපියල් $x$ ද දොඩම් ගෙඩියක මිල රුපියල් $y$ ද ලෙස ගෙන සමගාමී සමීකරණ යුගලයක් ලියා විසඳීමෙන් අඹ ගෙඩියක හා දොඩම් ගෙඩියක මිල වෙන වෙනම සොයන්න.

**06.** කෙසෙල් කැන් 100 ක ඇති කෙසෙල් ගෙඩි ගණන පිළිබඳ තොරතුරු ඇතුලත් අසම්පූර්ණ වගුවක් පහත දැක් වේ.

| කෙසෙල් කැනක ඇති ගෙඩි ගණන | කෙසෙල් කැන් ගණන ($f$) | මධ්‍ය අගය ($x$) | $fx$ |
|---|---|---|---|
| 50 – 60 | 20 | | |
| 60 – 70 | 25 | | |
| 70 – 80 | 30 | | |
| 80 – 90 | 15 | | |
| 90 – 100 | 10 | | |

**(i)** මෙම ව්‍යාප්තියේ මාත පන්තිය කුමක්ද?


**(ii)** ඉහත වගුව උත්තර පත්‍රයට පිටපත් කරගෙන $x$ හා $fx$ තීර සම්පූර්ණකර කෙසෙල් කැනක ඇති මධ්‍යන්‍ය ගෙඩි ගණන සොයන්න.

**(iii)** කෙසෙල් ගෙඩියක් රුපියල් 8 බැගින් විකුණුවේ නම් කෙසෙල් කැන් 100 ක් විකිණීමෙන් ලැබෙන ආදායම රුපියල් 58 000 නොඉක්මවන බව හේතු සහිතව පෙන්වන්න.

## B කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**07.** එක්තරා උත්සව අවස්ථාවක් සඳහා විදුලි බුබුලු වලින් සැකසූ සැරසිල්ලක වෘත්තාකාර වළලු ලෙස විදුලි බුබුලු සවිකර තිබූ ආකාරය රූපයේ දැක් වේ.



**(i)** කුඩාම වළල්ලේ සිට වළලු හතරක ඇති විදුලි බුබුලු ගණන ආරෝහණ පිළිවෙලට ලියා දක්වන්න.

**(ii)** n වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන සඳහා n ඇසුරෙන් ප්‍රකාශනයක් ලියන්න.

**(iii)** ඒ ඇසුරෙන් 15 වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන සොයන්න.

**(iv)** ඉහත සැරසිල්ලේ විදුලි බුබුලු 62 ක් ඇත්තේ කී වෙනි වළල්ලේ ද?

**(v)** $(n-1)$ වන වළල්ලේ ඇති විදුලි බුබුලු ගණන $2n$ බව පෙන්වන්න.

**08.** cm / mm පරිමාණය සහිත, සරල දාරයක්, කවකටුවක් හා පැන්සලක් පමණක් භාවිතාකර නිර්මාණ රේඛා පැහැදිලිව දක්වමින්,

**(i)** $PQ = 7$ cm ද $Q\hat{P}R = 60^{o}$ ද $PR = 6.5$ cm ද වන සේ PQR ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

**(ii)** QR හි දිග මැන ලියන්න.

**(iii)** PQ හි ලම්බ සමච්ඡේදකය නිර්මාණය කරන්න.

**(iv)** $Q\hat{P}R$ හි කෝණ සම්ඡේදකය නිර්මාණයකර ඉහත ලම්බ සමච්ඡේදකය සමග ඡේදනය වන ලක්ෂ්‍යය O ලෙස නම් කරන්න.

www.mathsland.org

**(v)** O කේන්ද්‍රය ද OP අරය ද වන සේ වෘත්තයක් නිර්මාණය කරන්න.

**09.** එකම තරමේ හා එකම වර්ගයේ අංක 1 සිට 8 තෙක් අංක ලියා රෝල් කර ඇති කඩදාසි තුණ්ඩු දැමූ පෙට්ටියකින් අහඹු ලෙස තුණ්ඩුවක් ඉවතට ගනු ලැබේ.

**(i)** ලැබිය හැකි සියළු ප්‍රතිඵල ඇතුලත් නියැදි අවකාශය ලියා දක්වන්න.

**(ii)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් කර ඇති සංඛ්‍යාව ඔත්තේ සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.


**(iii)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් කර ඇති සංඛ්‍යාව ප්‍රථමක සංඛ්‍යාවක් නොවීමේ සම්භාවිතාව සොයන්න.

**(iv)** ඉවතට ගන්නා ලද තුණ්ඩුවේ සටහන් සංඛ්‍යාව ඉරට්ට සංඛ්‍යාවක් හෝ වර්ග සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

**(v)** පළමුව ගන්නා ලද තුණ්ඩුව ඔත්තේ සංඛ්‍යාවක් නොවූයේ නම් නැවත එම තුණ්ඩුව පෙට්ටියට නොදමා ආපසු තුණ්ඩුවක් ගත් විට එය ඔත්තේ සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

**10.** **(a)** දිගංශය මැනීම සඳහා භාවිතා කරන උපකරණය නම් කර එහි දළ රූපයක් අඳින්න.


**(b)** A නම් ලක්ෂ්‍යයක සිට උතුරු දිශාවට විහිදී ඇති පාරක පිහිටි Q නම් ලක්ෂ්‍යයට නැගෙනහිරින් පිහිටා ඇති P නම් ස්ථානයේ ඇති ගසක් A සිට බැලූ විට $030^{o}$ ක දිගංශයකින් ද A ට 10 m ක් දුරින් පිහිටි B නම් ලක්ෂ්‍යයක සිට බැලූ විට අංශක $060^{o}$ දිගංශයකින්ද පෙනේ.




1 cm කින් 2 m දැක්වෙන පරිමාණයට ඉහත තොරතුරු රූප සටහනක් මගින් දක්වා P සිට බලන විට A හි දිගංශයත් P සිට Q ට ඇති දුරත් ගණනය කරන්න.

www.mathsland.org


**11.** දී ඇති රූපයේ AB = AC වන අතර AC සහ PR රේඛා සමාන්තර ද AB සහ QR රේඛා සමාන්තර ද වේ.




**(i)** PQR ත්‍රිකෝණය සමද්විපාද ත්‍රිකෝණයක් බව සාධනය කරන්න.

**(ii)** PB = QC නම් ABC සහ PQR ත්‍රිකෝණ අංග සම වන බව පෙන්වා PQ = 7 cm ද PR = 5 cm ද වන විට ABC ත්‍රිකෝණයේ පරිමිතිය ගණනය කරන්න.

**12.** රූපයේ දැක්වෙන්නේ O කේන්ද්‍රය වූ වෘත්තයකි. $O\hat{A}C = x$ වේ.




**(a)** හේතු දක්වමින් පහත දැක්වෙන කෝණවල විශාලත්වය $x$ ඇසුරෙන් සොයන්න.

**(i)** $A\hat{C}O$

**(ii)** $B\hat{O}C$

**(iii)** $O\hat{B}C$

**(b)** $A\hat{C}B$ හි අගය අංශක කීයද?

**(c)** AC = 12 cm ද BC = 9 cm ද නම් AB හි දිග කොපමණද?